# මාධ්‍යකරණ අවකාශය තුළ පශ්චාත් සාහිත්‍යික විශේෂතා



**වියුඩර් වීරසිංහ**

සමකාලීන සංහතික මාධ්‍ය සහ සාහිත්‍යය අතර ඇති සම්බන්ධතාව ඉතා සංකීර්ණ ස්වභාවයක් ගන්නා අතර එය තවම එහි සෑම පාර්ශ්වයකින්ම ආවරණය වන ආකාරය ගැඹුරින් අධ්‍යයනය කර නොමැත. සංහතික මාධ්‍ය සහ සාහිත්‍යය අතර අන්තර් සම්බන්ධතාව සලකා බැලීමේදී එක් කාරණයක් ඉතා පැහැදිලිය. එනම්, සාහිත්‍යයෙහි පෙර වූ ප්‍රමුඛස්ථානය අහිමි වී යෑම, සංහතික මාධ්‍යයෙහි ආධිපත්‍ය සර්වාධිකාරීව වර්ධනය වීම, සාහිත්‍යයේ ස්වරූප සහ විවිධ සංහතික මාධ්‍ය තුළ භාවිතයට පැමිණීම සහ සාහිත්‍යය සංහතිකකරණය මෙන්ම මාධ්‍යකරණය වීම කැපී පෙනේ. සංහතික මාධ්‍යයෙහි සාහිත්‍යාධිකත්වයේ ප්‍රමාණවත් බව පිළිබඳ මායාව නිර්මාණය කරමින් සාහිත්‍යයෙහි ස්වරූප ශෛලීන් සහ

විධි මාධ්‍යකරණය වන්නේය. වර්තමානයේ සාහිත්‍යයේ අවකාශය සංහතික මාධ්‍ය අවකාශය මඟින් විතැන් කිරීමේ ප්‍රවණතාව තීව්‍ර වෙමින් පවතී.

18 වැනි සියවසේ සිට 20 වැනි සියවස දක්වා කලාත්මක සාහිත්‍යය ලෝක සංස්කෘතියේ මූලික පදනම බවට පත්වී තිබිණ. එය දේශපාලනය, දර්ශනවාදය, ජාතික මනෝභාවය සංස්කෘතික අනන්‍යතාව සෞන්දර්යාත්ම රසඥතාව, අධ්‍යාපනය ඇතුළු මානව සත්තාවේ සහ නිර්මාණකරණයේ සියලුම පැතිකඩ කෙරෙහි බලපෑවේය. එපමණක් නොව ඉහත සියවස් තුන තුළ සාහිත්‍යය ලෝක පුවත්පත්වේදයට, සිනමාවේදයට මෙන්ම සංහතික මාධ්‍යකරණයට ද සුවිශාල බලපෑමක් කරමින් අදාළ තීන්දුවල ගුණාත්මක වර්ධනය සඳහා වැදගත් දායකත්වයක් සැපයීය. එසේම අදාළ යුගයේ ලෝක සාහිත්‍යය සංස්කෘතික සහ සමාජ අනුස්ථාපනයන් හැඩගැස්වීමෙහිලා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළේය. නිදර්ශන වශයෙන් 19 වැනි සියවසේ රුසියානු සම්භාව්‍ය සාහිත්‍යය ද ඉංග්‍රීසි සම්භාව්‍ය සාහිත්‍යය ද ශ්‍රී ලාංකේය සම්භාව්‍ය සාහිත්‍යය ද ඒ ඒ කාල වකවානු තුළ දී සමාජ කවිකාරක ක්‍රියාවලියට සහ ජනතාවගේ ජීවන දෘෂ්ටිය ආවර්ජනය කිරීමෙහිලා සුවිශාල මෙහෙවරක් සිදුකළ බව පෙන්වා දිය යුතුය.

පශ්චාත් සම්භාව්‍ය යුගයේ සහ පශ්චාත් නූතනත්වය තුළ සංහතික මාධ්‍ය සහ සාහිත්‍යය අතර වූ අන්තර් සම්බන්ධතාව, අන්‍යෝන්‍ය සම්බන්ධතාව මූලමය වශයෙන් වෙනස් වී සාහිත්‍යයේ ශෛලීන්, ස්වරූප විධි කෙරෙහි සංහතික මාධ්‍ය සහ නව මාධ්‍ය මඟින් ඇති කරන බලපෑම වර්ධනය වී ඇති අතර, සාහිත්‍යයේ සියලුම ප්‍රකාශන ක්‍රම සහ විධි මාධ්‍ය මඟින් සක්‍රීය ලෙස භාවිත කරමින් සිටී. මේ අනුව ඉහත තත්ත්වයන් සාහිත්‍ය ක්‍රියාවලිය, ලේඛකයින්ගේ ඉරණම, පොදු සංස්කෘතික වර්ධනය, මාධ්‍ය තුළ ස්වරූප සාධනය සහ එහි අර්ථ සන්දර්භය කෙරෙහි තීරණාත්මකව බලපාන්නේය. පෙර ඓන්ද්‍රිය ලෙස සාහිත්‍යයට ආවේණිකව තිබූ පරිකල්පනය, හරඹ, රස වින්දනය, අත්හදා බැලීම්, සොම්නස, නිරූපණය, වර්තමානයේ දී වඩ වඩාත් සංහතික මාධ්‍ය අවකාශයට ඇතුළත්ව තිබෙන බව පෙනේ. මෙහිදී ඒවා වේශ නිරූපිත සහ



විපරිවර්ධිත ආකාරයකින් අලුත් කාර්යයන් සහ ස්වරූප අත්පත් කරගෙන තිබේ.

සම්භාව්‍ය සාහිත්‍යය මානව සමාජය තුළ විවිධාකාර කාර්යයන් ඉටු කරමින් සමාජයේ ප්‍රශස්ත පැවැත්මට සහ ක්‍රියාකාරිත්වයට ආවශ්‍යයික පසුබිම සකස් කළේය. මානව සමාජ පරිණාමයෙහි සමාජ අවධිය තුළ සම්භාව්‍ය සාහිත්‍යය බිහි වී එහි මනා පැවැත්ම සහ ක්‍රියාකාරිත්වය සඳහා සම්භාව්‍ය සාහිත්‍යය ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන් අතර සමාජ සත්භාවාත්මක කාර්ය, දාර්ශනික සාංදෘෂ්ටිවාදාත්මක කාර්ය, අර්ථ ප්‍රතිනිෂ්පාදනාත්මක කාර්ය, ශික්ෂණාත්මක කාර්ය, ඇතුළු තවත් බොහෝ කාර්යයන් ඉටු කළ අතර, අද්‍යතන සාහිත්‍යය එනම්, මානව සමාජ පරිණාමයෙහි උපරි සමාජ අවධියේ සාහිත්‍යය එහි පශ්චාත් සාහිත්‍ය තත්ත්වය දක්වා ගමන් කර සාහිත්‍ය සමාජ අවධියෙහි ඉටු කරන ලද කාර්යයන් දුර්වලවී හෝ ඉන් ඉවත් ඇත.

මානව සමාජ පරිණාමයේ උපරි සමාජ අවධියේ දී සාහිත්‍යයේ සම්භාෂණ සහ සමාශ්‍ර කාර්ය සම්පූර්ණයෙන්ම සංහතික සහ නව මාධ්‍ය මඟින් ආක්‍රමණය කොට ඇත. සම්භාව්‍ය සාහිත්‍යය ආකෘතිය තුළ විඥාපනයේ මූලාශ්‍රය ලෙස ක්‍රියා කරන්නේ ලේඛකයා වන අතර පාඨකයා එහි ප්‍රතිග්‍රාහකයා වේ. ලේඛකයා විසින් නිර්මාණික පඨිතය පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය පාඨකයා සතු වන්නේය. ලේඛකයා පාඨකයා සංවාදය ඓතිහාසික වශයෙන් හැඩගැසී ඇත්තේ ලේඛකයාගේ ප්‍රමුඛතාව පරිකල්පනිකව පිළිගැනීමේ මාදිලිය තුළය. ලේඛකයා සාහිත්‍ය නිර්මාණයේ නිර්මාතෘ මෙන්ම එහි කලාත්මක අදහස්වල සංවාහකයා ද වන්නේය.

සමකාලීන උපරි සමාජ මාධ්‍යයික සන්නිවේදනාත්මක ආකෘතිය තුළ සාහිත්‍යය ඊට වඩා වෙනස් සුසවාදර්ශයක් වර්ධනය කරන්නේය. මෙහි ලේඛකයා විවෘත අවකාශයෙහි මෙහෙයවන්නා ලෙස ක්‍රියා කරමින් ලේඛකයා සහ පාඨකයා සහනිර්මාණය බිහි කරන්නේය. සම්භාව්‍ය සම්ප්‍රදාය තුළ සාහිත්‍ය නිර්මාණය භෞතික සහ අර්ථමය සාමාස්තිකභාවයක් ගනිමින් එය අර්ථකථනය සඳහා පමණක් විවෘතව පවතින්නේය. නමුත්, සමකාලීන උපරි සමාජ

ජාලීය අවකාශය තුළ ඇතැමවිට සුදන්ම කරන ලද නිර්මාණයක් නොපවතින අතර, එය නිරූපණය ද නොවන්නේය. එය සෑම කාලය තුළ සජීවී ලෙස ප්‍රදර්ශනය වන්නේය. මේ තත්ත්වය තුළ සාහිත්‍ය නිර්මාණය සහ ලේඛකයා නිර්මාණය වෙනුවෙන් පුද්ගලික වගකීමෙන් බැහැර වන්නේය. මෙය උපරි සමාජ අවධියේ පශ්චාත් සාහිත්‍යයේ විශේෂ ලක්ෂණයකි.

වර්තමාන සාහිත්‍ය කලා ක්ෂේත්‍රයෙහි ඓතිහාසික පරිණාමය පැහැදිලි කරන විඥාපනවේදී ප්‍රවේශය සම්බන්ධව කතා කිරීමේ දී පශ්චාත් නූතනවාදියෙකු වන ජීන් බෝද්‍රිල්ලාඩ් විසින් ඉදිරිපත් කර ඇති අදහස් කෙරෙහි අපගේ විශේෂ අවධානය යොමු විය යුතුය. බෝද්‍රිල්ලාඩ් බටහිර සංස්කෘතියේ ඓතිහාසික පරිණාමය නියෝජනයේ හෝ නිරූපණයේ සිට සදෘශතා හෝ හෝ වාස්තරූපීතාව දක්වා ප්‍රගමනය වූ සංස්කෘතියක් බව පෙන්වා දෙයි. මෙම අදහස එනම්, බටහිර සාහිත්‍ය කලා මාදිලිය සමකාලීනව ප්‍රකට වන්නා වූ සදෘශාකාරතා වින්‍යාස (Orders of the Simulocia) ත්‍රිත්වයක් ඔස්සේ පරිණාමය වී ඇති බව ඔහු පෙන්වා දෙන්නේය (Baudrillard, 1994). බටහිර සංස්කෘතිය විස්තර කරන මෙම බෝද්‍රිල්ලාඩියානු ක්‍රමවේදය මානව වර්ගයාගේ සාහිත්‍ය පූර්ව සමාජ අවධියේ සිට සමාජ අවධිය පසුකොට උපරි සමාජ අවධිය දක්වා වූ පරිණාමය ගෙනහැර දැක්වීම සඳහා යොදාගත හැකි එක් ක්‍රමවේදී සහ සංකල්පීය ප්‍රවේශයක් ලෙස භාවිත කළ හැකි බව අපගේ අදහසයි. සාහිත්‍ය කලාව යනු සංඥා පද්ධති පාදකව හෝ සංඥා පද්ධති අනුසාරයෙන් සුන්දරත්වයේ මූලධර්මවලට අනුව යථාර්ථය පරාවර්තනය කිරීමේ සුවිශේෂී මානව භාවිතයක්ය යන ආස්ථානයේ සිට සංකල්පියකරණය කිරීම වැදගත් වේ. මේ අනුව සාහිත්‍ය කලා මඟින් ඓතිහාසිකව සිදු කරන ලද අර්ථ පාදක රසඥතාවේ සමකාලීන පරිණාමීය ගති ලක්ෂණ කෙරෙහි අපගේ අවධානය යොමුවන බව සඳහන් කළ යුතුය. මෙහිදී පූර්ව සමාජ අවධියෙහි සමාජ අවධියෙහි සහ උපරි සමාජ අවධියෙහි සාහිත්‍ය පඨනවල ගුණාත්මකභාවය සහ අර්ථසාරය එකිනෙකට වෙනස් වන්නේ අදාළ ඓතිහාසික යුගයන් තුළ සාහිත්‍ය කලාව මඟින් යථාර්ථය පරාවර්තනය කරන ගැඹුර සහ තීව්‍රතාව මතය. විශේෂයෙන් සංඥා සහ සංඥා



පද්ධති මඟින් යථාර්ථය පරාවර්තනය කිරීමේ මට්ටම සහ ගැඹුර මත සදෘශාකාරණ වින්‍යාස එකිනෙකට අනුව වෙනස් වන්නේය. සාහිත්‍යයේ ඓතිහාසික පරිණාමයන් සමගම එම සාහිත්‍යය කලා ප්‍රභේද මඟින් යථාර්ථය පරාවර්තනය කිරීමේ මාදිලිය, ස්වරූපය, ශෛලිය වෙනස් වූ අතර යථාර්ථයේ පරාවර්තනය ක්‍රමානුකූලව අදාළ යථාර්ථයෙන් විස්ථාපනය වීමේ ප්‍රවණතාව සාහිත්‍යයේ වර්ධනයේ ඓතිහාසික ප්‍රවණතාවක් වශයෙන් ප්‍රකටීකරණය වූ බව පෙනේ. බෝද්‍රිල්ලාඩ් සිය සදෘශාකරණ වින්‍යාස ත්‍රිත්වය බටහිර සමාජ, සංස්කෘතික විඥාපනික පරිණාමයෙහි යුග ත්‍රිත්වයකට සම්බන්ධව ඉදිරිපත් කරයි. ඒ අනුව පුනරුද යුගයේ (14 - 16 සියවසේ) සිට කාර්මික විප්ලවය ආරම්භක අවධිය 18 වන සියවස ආරම්භය තුළ යුරෝපා සංස්කෘතියේ ප්‍රථම සදෘශාකරණ වින්‍යාසයට අයත් වන අතර, කාර්මික විප්ලවයේ ආරම්භක අවධියේ (18 වන සියවස) සිට 20 වන සියවස මැද භාගය දක්වා වූ අවධිය හදවන සදෘශාකාරණ වින්‍යාසයට අයත් වන අතර 20 වන සියවස මැද භාගයේ සිට වර්තමානය දක්වා වූ අවධිය තෙවන සදෘශාකාරණ වින්‍යාසයට අයත් වේ.

මෙම බෝද්‍රිල්ලාසියානු සංකල්පය මානව සමාජ පරිණාමයේ පූර්ව නූතන, නූතන සහ පශ්චාත් නූතන මාදිලිය තුළ හෝ පූර්ව සමාජ අවධිය, සමාජ අවධිය සහ උපරි සමාජ අවධිය යන මාදිලිය තුළ හෝ සාහිත්‍ය කලා ක්ෂේත්‍රයෙහි ඇති වූ වර්ධනයේ සහ පරිණාමයේ විශේෂතා ගෙනහැර දැක්වීම සඳහා යොදාගත හැකිය.

මේ අනුව පූර්ව සමාජ අවධියෙහි එනම් පූර්ව නූතන අවධියෙහි මානව සාහිත්‍ය කලා ඇතුළු විඥාපනික නිෂ්පාදන මාදිලිය තුළ සංඥා සහ සංඥා පද්ධති පාදකව සාහිත්‍යවේදියා, කලාකරුවා යථාර්ථය පරාවර්තනය කිරීමේ මට්ටම සහ ගැඹුර සමඟ ඔහු ප්‍රස්තුත සමාජ හා සංස්කෘතික ප්‍රපංචවලට දක්වන සම්බන්ධතාව නිර්ණය විය. එහිදී ජීවිතය සහ යථාර්ථය වඩාත් නිශ්චිතව අදාළ සංඥා පද්ධති මඟින් පරාවර්තනය කළ අතර, සෑම පුද්ගලයෙකුම දැඩි ලෙස එකල පැවැති සමාජ සංස්කෘතික ව්‍යුහ තුළ ස්ථානගතව ඒවා සමඟ සජීවී අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්ව සන්දර්භයක් තුළ ජීවත් විය. බොහෝ විට අදාළ සංඥා හෝ සංඥා පද්ධති සහ මිනිස් සැබෑ ජීවිතය අතර

සුවිශාල වෙනස්කම් හෝ නොගැලපීම් දක්නට වූයේ නැත. එය මිනිසුන් සම්බන්ධ වූ සමාජ, දේශපාලන සංස්කෘතික සාහිත්‍යයික ආධ්‍යාත්මික ආදී ඕනෑම පැතිකඩකට එක සේ අදාළ විය. ඒවා පිළිබඳව ඔවුහු අවබෝධයකින් ජීවත් වූහ. එම නිසාම ඔවුන්ට යථාර්ථය සම්බන්ධව ප්‍රශ්නයක් නොවීය. එය පවතින්නා වූ ප්‍රත්‍යක්ෂ තත්ත්වයකි. මෙම විඥාපනික නිෂ්පාදන මාදිලියේ ස්වරූපය මධ්‍යහන යුගයේ චිත්‍ර කලා මූර්ති සහ සාහිත්‍ය නිර්මාණ ඔස්සේ අපට වටහා ගත හැකිය. මෙම යුගයේ සාහිත්‍ය කලා සහ යථාර්ථය පරාවර්තනය අතර පරතරය අතිශය අවම මට්ටමක පැවතිණ. කාර්මික විප්ලවය ධනේශ්වර සමාජය බිහිවීමත්, එහි ව්‍යාප්තියත් සමඟ යථාර්ථය පරාවර්තනය කිරීමේ විඥාපනික නිෂ්පාදන මාදිලියේ ද එහි ප්‍රකාශන මාධ්‍යයන්ගේ ද වර්ධනය ද සනිටුහන් කළේය. ක්‍රමානුකූලව මිනිසුන් සහ ස්වභාවධර්මය අතර ද මිනිසුන් සහ සමාජය අතර ද, මිනිසුන් මිනිසුන් අතර පැවැති සම්බන්ධතා සංකීර්ණ වෙමින් විවිධ දිශා ඔස්සේ විකරණය වෙමින් පෙර වූ සුසංයෝගය බිඳී යැමට තුඩු දුන්නේය. මේ තත්ත්වයත් සමඟ යථාර්ථය පරාවර්තනය කිරීම සඳහා වූ විඥාපනික නිෂ්පාදන මාදිලියේ පළමු අවධිය අවසානය කරා ළඟාවන අතර, කාර්මික විප්ලවය සංගතික නිෂ්පාදනය ධනේශ්වර සමාජ නාගරීකකරණය, වාණිජකරණය, ලිබරල්කරණය ආදී ප්‍රපංච සමඟ විඥාපනික නිෂ්පාදනය දෙවන මාදිලිය එනම්, සදෘශාකරණ වින්‍යාසයේ දෙවන අවධියට අවතීර්ණ වන්නේය. ක්‍රමානුකූලව කෘත්‍රිම භාණ්ඩ නිෂ්පාදනය සහ භාවිතය වර්ධනය වන අතර ස්වභාව ධර්මය අඛණ්ඩවම විකරණය කිරීමේ ප්‍රතිසංස්කරණය කිරීමේ විපරිවර්තනය කිරීමේ ප්‍රවණතාව මහ පරිමාණිකව ශීඝ්‍ර ලෙස වර්ධනය වෙමින් සංහතික නිෂ්පාදන ක්‍රියාවලිය තුළ ප්‍රතිනිෂ්පාදනීයතාව, පුනර්ජන්‍යතාව වේගයෙන් වර්ධනය වෙමින් සංස්කෘතික කලා සාහිත්‍ය නිර්මාණවල මුලාකෘති සහ එහි අනුරූප අතර වෙනස හඳුනා ගැනීමට නොහැකි අන්දමට සාහිත්‍ය කලා කෘතිවල තත්ත්වය සංකීර්ණ වූ අතර, මූලාකෘතිය හෝ සත්‍ය අව්‍යාජභාවය, නිර්ව්‍යාජභාවය පිළිබඳ ප්‍රශ්නය අනිශ්චේයක් බවට පරිවර්තනය විය. 19 වන සියවසේ දී බටහිර සමාජය කාර්මිකකරණය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් මානව අත්දැකීම් ප්‍රතිව්‍යුහකරණය වීමට බලපෑවේය. (Benjamin 1935 - 1936)



දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් පසුව විද්‍යාතාක්ෂණික ක්‍රියාවලියෙහි වූ විප්ලවීය වර්ධනය එසේම සන්නිවේදන සහ මාධ්‍ය තාක්ෂණික සහ තාක්ෂණවේදී ක්ෂේත්‍රය එහි ඇති වූ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක වර්ධනය මානව විඥාපනික නිෂ්පාදන මාදිලිය නව තත්ත්වයක් කරා පරිණාමය වීම සනිටුහන් කළ අතර, යථාර්ථය පරාවර්තනය කිරීම සහ සංඥා, සංඥාපද්ධති සහ සංඥා සංස්කෘතිය අතර සම්බන්ධතාව තවත් සංකීර්ණ තත්ත්වයකට පත්විය. මේ තත්ත්වය සමඟ බටහිර සංස්කෘතික පරිණාමයේ බෝඩ්‍රිල්ලාඩියානු සදෘශාකාරණා වින්‍යාස ත්‍රිත්වයේ තුන්වන හෙවත් අවසාන අවධිය සලකුණු කරන්නේය. මෙය කාර්මික යන්ත්‍ර යුගයේ සිට තොරතුරු යුගය දක්වා පරිවර්තනයක් වශයෙන් ද, නිෂ්පාදන සමාජයේ සිට පාරිභෝජන සමාජය දක්වා පරිවර්තනයක් වශයෙන් ද සමාජ අවධියේ සිට උපරි සමාජ අවධිය දක්වා පරිවර්තනයක් වශයෙන් ද නූතනත්වයේ සිට පශ්චාත් නූතනත්වය දක්වා පරිවර්තනයක් වශයෙන් ද සලකන අතර එහි දී යථාර්ථය අධියථාර්ථික තත්ත්වයක් දක්වා ද, සාහිත්‍ය කලා පශ්චාත් සාහිත්‍ය කලා තත්ත්වයක් දක්වා ද පරිවර්තනය වන්නේය.

මෙම උපරි සමාජීය තත්ත්වයන් තුළ විඥාපනික නිෂ්පාදන මාදිලිය වන සංඥා සංස්කෘතිය යථාර්ථයෙන් පූර්ණ නිදහසක් අත්පත් කර ගන්නේය. සංඥා සහ සංඥා පද්ධතිවල බහුලනය, ප්‍රාගුණ්‍යය ස්වයංජනනය නිසා ඒවා ආශ්‍රිතව 'නිර්මාණය' වන පඨිතවල යථාර්ථය සහ නිර්ව්‍යාජභාවය ප්‍රකට කරන ගුණ නැතිවී යන්නේය. එසේම යථාර්ථයෙන් ව්‍යුක්ත වූ සංඥා සංස්කෘතිය සහ නිෂ්පාදනයෙන් වියුක්ත වූ පාරිභෝජන සංස්කෘතිය මිනිසා පශ්චාත් මිනිසෙකු බවට පරිවර්තනය කරන්නේය. දැනට සම්මත සියලු සමාජ, දේශපාලන සංස්කෘතික, ආධ්‍යාත්මික සෞන්දර්යාත්මක සදාචාරාත්මක, ශික්ෂණාත්මක ප්‍රමිතීන් සහ ව්‍යුහයන් අර්බුදයට ගොස් විනාශ වී යන්නේය.

උපරි සමාජ විඥාපනික නිෂ්පාදන මාදිලිය තුළ සාහිත්‍ය කලා පඨිත නිෂ්පාදන ක්‍රියාවලිය මෙන්ම නිෂ්පාදිත පඨිත ද මූලික වශයෙන් ඊට පෙර වූ පඨිත නිෂ්පාදන ක්‍රියාවලියෙන් මෙන්ම නිෂ්පාදිත පඨිතවලින් වෙනස් වන්නේය. මෙහි දී සාහිත්‍ය පඨිතයේ

තොරතුරු සහ අර්ථය අතර සම්බන්ධතාව විමසා බැලීම වැදගත් වන්නේය. සාම්ප්‍රදායික හෝ පූර්ව නූතන සමාජයන්හි සාහිත්‍ය පඨිතයන් හා ඇතුළත් තොරතුරු සහ අර්ථ අතර වූයේ අවියෝජනීය, ඓන්ද්‍රිය සම්බන්ධතාවක් වන අතර සමහර විට තොරතුරු අභිබවා අර්ථ අවිනිශ්චය විය. සමාජ අවධියේ දී හෝ නූතනත්ව අවධියේ දී තොරතුරු සහ අර්ථ අතර සාපේක්ෂ නිදහස් සංචලනයක් සහ විකරණාත්මක ප්‍රවණතාව උත්සන්න වී තොරතුරු සහ අර්ථ අතර සුසංයෝගිතාවේ පරස්පරතා සහ ප්‍රතිවිරෝධතා ප්‍රකට වන්නට විය. උපරි සමාජ හෝ පශ්චාත් නූතනත්ව අවධියේ දී පඨිතයේ තොරතුරු සහ අර්ථ අතර පරස්පරතා සහ ප්‍රතිවිරෝධතා උත්සන්න වූවා පමණක් නොව, තොරතුරු සහිත අර්ථ විරහිත පඨිත මේ යුගයේ මූලික ප්‍රවණතාව වන්නේය. මේ අනුව මිනිසා යථාර්ථය සමඟ දක්වන ලද සම්බන්ධතාව සාහිත්‍ය කලා ක්ෂේත්‍රයට අදාළව යථාර්ථයේ පරාවර්තනය යථාර්ථයේ නිරූපණය, නිරූපණයේ ප්‍රතිනිරූපණය, ප්‍රතිනිරූපණයේ ප්‍රතිනිරූපණය දක්වා ඓතිහාසිකව පරිණාමය වී අද්‍යතනය වන විට ගෝලීය සාහිත්‍ය කලා අවකාශයේ ප්‍රබල ප්‍රවණතාවක් බවට පත්වී තිබේ.

මේ අනුව පශ්චාත් සාහිත්‍ය පඨිත සම්භාව්‍ය අර්ථයෙන් සාහිත්‍යය නිෂේධනය කරන අතර, මානව සමාජයෙහි සාහිත්‍ය සතු වූ සත්තාත්මක කෘත්‍යාත්මක ක්‍රමවේදාත්මක, ශික්ෂණාත්මක දෘෂ්ටිවාදාත්මක ප්‍රජනනාත්මක සම්ප්‍රේෂණාත්මක, නිර්මාණාත්මක කාර්යයන් අහිමි කර ගනිමින් එය යාන්ත්‍රික, අර්ථ විරහිත, නිස්සාර නිර්භේතීය තත්ත්වයකට පරිවර්තනය වන්නේය. පෙරදී නිර්මාණාත්මක ක්‍රියාවලියට එතරම් අදාළ නොවූ සමාජයෙන් නිවේදනාත්මක ක්‍රියාවලිය වර්තමානය වන විට අන්තර්ක්‍රියාකාරී ප්‍රවණතා ප්‍රබල බලපෑමක් කරමින් මධ්‍යයික සාහිත්‍ය කලා අවකාශය තුළ වර්ධනය වෙමින් පවතී. දැනට වර්ධනය වෙමින් පවතින සාහිත්‍ය කලා සුසමාදර්ශය සාම්ප්‍රදායික සාහිත්‍ය කලා සුසමාදර්ශයට සම්පූර්ණයෙන් ප්‍රතිවිරෝධී වන අතර එය ලේඛකයා සහ පාඨකයා අතර සංවාදයට කේන්ද්‍රීය වැදගත්කමක් සපයන්නේ මානව විඥාපනික නිෂ්පාදන මාදිලියෙහි හැඩගැසෙන්නා වූ බුද්ධිමය ස්වරූප සහ ආගමනයවෙමින් පවතින්නා වූ නව තාක්ෂණික භාවිතයන්



සාහිත්‍ය කලා ක්ෂේත්‍රය අබියස අලුත් අභියෝග සහ අවශ්‍යතා මතු කරමින් මිනිස් විඥානය තුළ විප්ලවීය විපරිවර්තනයන් සිදුකරන අතර, අවසානයේ පශ්චාත් විඥානික තත්ත්වයක් උදාකරන්නේය. මෙම ක්‍රියාවලීන් තුළ එකඟ විය නොහැකි බරපතළ අනතුරුදායක තත්ත්වයන් උද්ගත වන බව පෙන්වා දිය යුතුය. ක්‍රමානුකූලව කලාවේ, සාහිත්‍යයේ නිර්වචනාත්මක තත්ත්වයන් වෙනස් වන්නේය. කලාව යනු කුමක්ද? යන ප්‍රශ්නාර්ථයක් වන අතර කලාවේ සීමා සාහිත්‍යයේ සීමා මැකී යන්නේය. ලේඛකයා යනු කවුද? පාඨකයා යනු කවුද? කලාකරුවා යනු කවුද? පාඨකයා යනු කවුද? කලාකරුවා යනු කවුද යන පෙරදී ඉතාම සරල වූ ද, පැහැදිලි වූ ද ප්‍රශ්න දැන් සංකීර්ණ වන්නේය. අපැහැදිලි වන්නේය.

මේ අනුව සංහතික මාධ්‍ය සන්නිවේදන අවකාශය තුළ කලා සහ සාහිත්‍ය නිර්මාණයන්ගේ අද්විතීය ගුණය නැති වී යන්නේය. එසේම ලේඛකයා සහ පාඨකයා තමන්ටම ආවේණික ලෝක තුළ වූ පැවැත්ම නවතා සංහතික මාධ්‍යයික අවකාශයෙහි සහජීවනයට පිවිසෙන්නේය. නමුත්, අනතුරු කොහේද, එහි මිදීම වර්ධනය වන්නේය (Heidegger, 1927). සංහතික මාධ්‍ය කලාවට, සාහිත්‍යයට පමණක් නොව, යථාර්ථයට පවා සිදුකර සර්වාධිකාරි බලපෑමට එරෙහිව සියලු ස්වරූපයන්ගේ සහ හැකියාවන්ගෙන් ප්‍රතිරෝධයක් ඇති කිරීම, ඊට පිළිතුරක් ලෙස මාටින් හයිඩගර් පෙන්වා දෙන්නේය. තවත් සමකාලීන දාර්ශනිකයෙකු වන ස්ලැවෝජ් ජිජැක් පශ්චාත් නූතන මාධ්‍යයට තිබෙන සම්බන්ධතාව ප්‍රකාශ කරන්නේ සංත්‍රාසාත්මකවය. "Media are here" ඔහු මෙයට දෙන පිළිතුර ඉතා සරලය. "No Thanks!"

21 සියවස ආරම්භයේ දී සාහිත්‍ය කේන්ද්‍රවාදයේ අර්බුදයත් සමඟ සාහිත්‍යය කෙරෙහි වූ සමාජ ලැදියාව පහත වැටීම ප්‍රවණතාවක් ලෙස වර්ධනය වන්නට විය. මෙම ක්ෂේත්‍රය තුළ අලුත් සංස්කෘතික භාවිතයන් නිර්මාණය වූ අතර, සංහතික සහ නව මාධ්‍ය සංස්කෘතියේ ව්‍යාප්තිය කේන්ද්‍රියව වර්ධනය වූ මාධ්‍ය ප්‍රපංචයන් ප්‍රධාන වේ. 20 වන සියවස අවසානයේ සහ 21 වන සියවස ආරම්භයේ සාහිත්‍ය වඩවඩාත් තාක්ෂණික සහ උපයෝග නාත්මක ගති ලක්ෂණ අත්පත් කරගත් බව පෙනේ.

මේ අනුව සාහිත්‍ය කලා ඇතුළු මානව සංස්කෘතිය සිය ප්‍රාරම්භක තත්ත්වයෙන් විතැන්ව එය සුවිශේෂ උපරි සමාජ විඥාපනික නිෂ්පාදන මාදිලියක් බවට පත්වීම තුළ එය සිය පරිණාමයේ පශ්චාත් විඥාපනික නිෂ්පාදන තලයට ප්‍රවිෂ්ට වී ඇති බව අවධාරණය කළ යුතුය. මෙහිදී සමාජ විඥාපනික නිෂ්පාදන මාදිලිය පශ්චාත් සමාජ විඥාපන නිෂ්පාදන මාදිලියක් බවට පත් වූ විට එහි ප්‍රධාන සංරචක දෙකක් අපට නිරීක්ෂණය කළ හැකිය. ඉන් පළමු වැන්න සංඛ්‍යාංක සංශ්ලේෂිය රූපක වන අතර, දෙවැන්න සදෘශාකාරතාව (ව්‍යාජරූපීතාව) වේ. මෙහි පළමු වැන්න පශ්චාත් සමාජ විඥාපනික නිෂ්පාදන මාදිලියේ අවශ්‍යයික තාක්ෂණික සහ තාක්ෂණයේ දී පදනම ද දෙවැන්න ඊට ආවශ්‍යයික පශ්චාත් සංඥාර්ථික පදනම සකස් කරනු ලැබේ. මේ සංරචක ද්වයේ එකාබද්ධතාව මත පශ්චාත් සමාජ විඥාපනික නිෂ්පාදන මාදිලිය නිර්මාණය වන අතර, ඉන්පසු එම විඥාපනික නිෂ්පාදන මාදිලියට අදාළ සෙසු මාන නිර්මාණය වන්නේය. පශ්චාත් යථාර්ථය (අධි යථාර්ථය), තථ්‍යාසන්න යථාර්ථය (තථ්‍යසම යථාර්ථය), පශ්චාත් කාලය, පශ්චාත් අවකාශය පශ්චාත් චලනය ආදී මූලිකාංග නිර්මාණය වී පසුව ඒවා පාදකව පශ්චාත් විඥාපනික නිෂ්පාදන මාදිලියෙහි විවිධ පශ්චාත් පුද්ගල හෝ පශ්චාත් සමාජ විඥානික ස්වරූප වන පශ්චාත් සාහිත්‍යය, පශ්චාත් කලාව, පශ්චාත් දේශපාලන, පශ්චාත් විද්‍යාව ආදී පශ්චාත් ස්වරූප නිර්මාණය වන්නේය. මේ අනුව සමකාලීන මාධ්‍ය සංස්කෘතිය තුළ ජීවත් වන මිනිසා යථාර්ථය සමඟ වූ සියලු සම්බන්ධතා නැති කර ගන්නේ ය. ඒ අනුව පශ්චාත් නූතන මිනිසා දැනීමේ හැකියාවේ සිට වේග නිරූපණය දක්වා සංක්‍රාන්තික වේ (වීරසිංහ 2013).

සම්භාව්‍ය අර්ථයෙන් ගත් කල කලාව සහ සාහිත්‍යය යනු ස්වභාවධර්මය අනුකරණය සහ සමාජ ලෝකය පරාවර්තනය කිරීමේ සෞන්දර්යාත්මක භාවිතයකි. එහි දී සංවේදී සහ වියුක්ත චින්තනය ඒකීය සමස්තයක් ලෙස ක්‍රියා කරමින් සුන්දරත්වයේ නියමයන්ට අනුකූලව යථාර්ථය අර්ථ කේන්ද්‍රිය පද්ධතියක් තුළ පරාවර්තනය කරනු ලැබේ. අද්‍යතනයේ දී යථාර්ථය අධියථාර්ථීක වන අතර කලාව මඟින් එය සිතියම්කරණය කරමින් අධි යථාර්ථය ක්ෂේත්‍රය තුළ එය සාක්ෂාත් කරගනු ලැබේ. මෙය ඇත්ත වශයෙන්ම



යථාර්ථයේ සහ කලාවේ අවසානය සනිටුහන් නොකරන්නේද? බෝද්‍රිලාර්ඩ්ට අනුව ඊට පිළිතුර 'නැත' යන්න වන අතර, ඔහුට අනුව අධි යථාර්ථවාදය යනු කලාවේ සහ යථාර්ථයේ උසස්ම ස්වරූපය වන්නේය. අධියථාර්ථිකත්වයේ ප්‍රධාන ගුණය වන්නේ සදෘශාකාරතාව හෝ ව්‍යාජරූපිතාවයි. බෝද්‍රිලාර්ඩ් අනුව අප ජීවත්වන්නේ යථාර්ථයේ මායාකාරී සෞන්දර්යාත්මක ලෝකයකය. එම සෞන්දර්යාත්මකභාවය පෙර දී (සම්භාව්‍ය අවධියේ දී) මෙන් අප විසින් සාක්ෂාත් කරගනු ලබන්නේ තවදුරටත් අදහස් සහ කලාත්මක පරතර ආධාරයෙන් නොව, යථාර්ථය දෙවැනි මට්ටමකට ගොඩනැඟීම තුළ බව ඔහු අවධාරණය කරන්නේය (Baudrillord, 1992). වර්තමානයේ අප ජීවත් වන්නේ මූලාකෘති අහිමි කරන්, නැතිවී ගිය අසංවේය අදහස්වල ප්‍රතිරූපණ, මනන් සෘෂ්ටි රූපක, සිහින අතරය. නිදර්ශනයක් වශයෙන් ප්‍රගතිය පිළිබඳ අදහස් අතුරුදහන්ව ගොස් ඇතත් ප්‍රගතියේ මායාව පවතින්නේය. දේශපාලන ක්ෂේත්‍රයෙහි දේශපාලනය යන අදහස අතුරුදහන්ව ගොස් ඇතත් දේශපාලන සෙල්ලම දිගටම කරගෙන යන්නේය. කලා සාහිත්‍ය ක්ෂේත්‍රයෙහි සෞන්දර්ය සහ සුන්දරත්වය පිළිබඳ අදහස අතුරුදහන්ව ගොස් ඇතත් සෞන්දර්යයේ සහ සුන්දරත්වයේ මායාව කලාවේ සහ සාහිත්‍යයේ නාමයෙන් පවතින්නේය. නමුත්, එය පවතින්නේ සාහිත්‍ය කලාව ලෙස නොව, පශ්චාත් සාහිත්‍ය කලාව ලෙස බව අවධාරණය කළ යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ


Baudrillard J., (1994), **Simulacra and Simulation**, Ann Arbour University of Michigon Press.

Benjamin, W., (1935 - 1936) **The Work of Art in the age of its mechanical reproductibility. Art key contemporary thinkers.** Eds. Diarmuid Costelle and Jonathan Nickery, Oxford, UK.

Heidegger M., (1927) **Being and Time** Sage Publishers, London.

වීරසිංහ වී. (2013), ගෝලීය සමාජය සහ එහි දෘෂ්ටිවාදය, ආණමඩුව, නෝනැත්ත පබ්ලිෂින් හවුස්.

Baudrillard J., (1992), **The Disappearance of Art and Politics**, London, Macmillon.